ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## ඉන්දියාවේ අග්‍රාමාත්‍ය ගති ශක්ති නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ සංචාරයක

ඉන්දීය රජයේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ උපදේශක අනිෂ් කුමාර් මහතා ප්‍රමුඛ ඉන්දීය නිල නියෝජිත පිරිසක් 2024 ජූලි 8 – 9 දිනවල ශ්‍රී ලංකාවේ සංචාරයක නිරත විය. මෙම නියෝජිත පිරිස ශ්‍රී ලංකාවේ විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමු වී ඉන්දියාවේ ඒකාබද්ධ යටිතල පහසුකම් සංවර්ධනය අරමුණු කරගත් ඉන්දීය අග්‍රාමාත්‍යතුමාගේ (PM) ගති ශක්ති (වේගයේ බලය) වැඩසටහන පිළිබඳ සාකච්ඡා පැවැත්වීය. මෑත වර්ෂවලදී ඉන්දියාව ළඟා කරගත් වේගවත් යටිතල පහසුකම් සංවර්ධනයේ රහස වන්නේ මෙම වැඩසටහන යි. මෙම සංචාරය අග්‍රාමාත්‍ය ලේකම් අනුර දිසානායක මහතා ප්‍රමුඛ නිල නියෝජිත පිරිසක් විසින් සිදු කළ සංචාරයකින් අනතුරුව සිදු වන අතර එම සංචාරයේ දී ශ්‍රී ලංකා නියෝජිත පිරිස PM ගති ශක්ති වැඩසටහන පිළිබදව දැනුවත් කරන ලදී.

2. දෙදින නිල ශ්‍රී ලංකා සංචාරය අතරතුරදී ඉන්දීය නියෝජිත පිරිස වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මහතා, අග්‍රාමාත්‍ය ලේකම්තුමා, ප්‍රවාහන සහ මහා මාර්ග අමාත්‍යාංශයේ ලේකම්තුමා, ජනාධිපති ලේකම් කාර්යාලයේ යටිතල පහසුකම් ව්‍යාපෘති සම්බන්ධයෙන් කටයුතු කරන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ මුදල් අමාත්‍යාංශයේ විවිධ දෙපාර්තමේන්තුවල නියෝජිතයන් හමු වූහ. එම නියෝජිත පිරිස ලංකා වාණිජ මණ්ඩලය සමඟ ද අදහස් හුවමාරු කර ගත්හ. මෙම සාකච්ඡාවන් හිදි ඉන්දීය නියෝජිත පිරිස සඳහන් කළේ ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතාවයන් සහ අවශ්‍යතාවයන් අනුව ඉන්දීය රජය ගති ශක්ති වැඩසටහනේ ප්‍රතිලාභ ශ්‍රී ලංකාව සමඟ බෙදා ගැනීමට සූදානමින් පසු වන බවයි.

3. PM ගති ශක්ති වැඩසටහන සුමට පුද්ගල සහ භාණ්ඩ සංචරණය සඳහා බහු විධ, පළමු සහ අවසාන සැතපුම් සම්බන්ධකතාවය සහතික කිරීම සඳහා තාක්ෂණයෙන් බල ගැන්වූ යටිතල පහසුකම් සංවර්ධන වේදිකාවකි. එය GIS තාක්ෂණය මත පදනම් වන අතර ඒකාබද්ධ සැලසුම් කරණය, එක්ව සිදු කරන ක්‍රියාත්මක කිරීම සහ ව්‍යාපෘති අධීක්ෂණය සඳහා දත්ත පදනම් කරගත් තීරණ ගැනීම සඳහා පහසුකම් සලසයි. PM ගති ශක්ති වැඩසටහන සැලසුම්කරණ ක්‍රියාවලියේ දී යටිතල පහසුකම් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ එකට එක් කරමින් සහ අදාළ සියලු යටිතල පහසුකම් සහ ජාතික මහා සැලැස්ම (මධ්‍යගත වේදිකාව) සහ ප්‍රාන්ත මහා සැලැස්ම (ප්‍රාන්ත සහ යූනියන් ප්‍රදේශවල කේවල පෝටල) සම්බන්ධයෙන් ස්වභාවික සම්පත් හා සම්බන්ධ GIS දත්ත ඇතුළු අනෙකුත් සම්පත් එක් කරමින් සහජීවනයන් නිර්මාණය කරයි.

***

***කොළඹ***
***2024 ජූලි 09***